මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார நிலைபேறு மற்றும் தேசிய கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION & NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01 இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 – 2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No:
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2024/06/18

## පුවත්පත් නිවේදනය

### ඉතා ඉහළ විනිමය අනුපාතයක් යොදා ගනිමින් මහා භාණ්ඩාගාරය විසින් ණය සේවාකරණය සිදුකර ඇති බවට පළවන මාධ්‍ය වාර්තා පිළිබඳව පැහැදිලි කිරීම

ඉහත මාධ්‍ය වාර්තාවලට පාදක වී ඇත්තේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් 2024 මැයි 31 වන දින ප්‍රකාශයට පත් කරන ලද අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාවෙහි (වාර්ෂික වාර්තාව) පිටු අංක 351 සිට ඇතුළත් කර ඇති *"රජයේ මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ විගණකාධිපති වාර්තාව"* යටතේ (ළ) අංකය අනුව ප්‍රකාශයට පත්කර ඇති පහත සඳහන් විගණන ඡේදයයි.

(ළ) රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 24(1) න් ඉදිරිපත් කර ඇති විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක ව්‍යාපෘති ණය ශේෂවලට (Foreign Currency Banking Unit Loan (Project) Balances) අදාළ CS-DRMS 854-1 වාර්තාව සමඟ පරීක්ෂා කිරීමේදී 2017045 දරන ණය ගිවිසුමට අදාළව 2022 දෙසැම්බර් 31 දිනට CS-DRMS 854-1 වාර්තාවෙහි සහ 2023 ජනවාරි 01 දිනට එම වාර්තාවේ USD 227,823 ක් හෙවත් රු.82,724,927 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, ණය ආපසු ගෙවීම් අතර ද USD 227,823 ක වෙනසක් නිරීක්ෂණය වුවද, එහි දේශීය මුදල් වටිනාකමෙහි කිසිදු වෙනසක් නිරීක්ෂණය නොවීය. තවද, රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව ආපසු ගෙවන ලද USD 332,704 ක මුදල දේශීය මුදල් බවට පරිවර්තනය කිරීමේදී USD 1 ක් රු.524.6050 ක් ලෙස අසාමාන්‍ය විදේශ විනිමය අනුපාතයක් යොදාගෙන ඇති බව නිරීක්ෂණය විය.

විගණන වාර්තාවේ සඳහන් එම විගණන ඡේදයට අදාළව ඕනෑම විගණන විමසුමකදී සාමාන්‍යයෙන් සිදුවන පරිදි මුදල් අමාත්‍යාංශය විසින් විගණකාධිපතිවරයා වෙත දැනටමත් පිළිතුරු ඉදිරිපත් කර තිබේ.

තවද, එම විගණන විමසුමෙහි සඳහන් පරිදි ඇමරිකානු ඩොලර් 332,704 ක් ගෙවීමේදී ඒ සඳහා ඇමරිකානු ඩොලර් හා ශ්‍රී ලංකා රුපියල් අතර විනිමය අනුපාතය ලෙස රුපියල් 524.6050 ක් යොදාගෙන නොමැත.

ඉහත ණය මුදල ලබාගෙන ඇත්තේ ඇමරිකානු ඩොලර් වලිනි. එහෙත්, අදාළ ණය ගිවිසුම් ප්‍රකාරව, ඊට අදාළ ණය වාරිකය ගෙවීම් සිදු කරනු ලබන්නේ ශ්‍රී ලංකා රුපියල් වලිනි. ඒ අනුව, 2022 වර්ෂයේ දී ඉහත ණය මුදලට අදාළව ගෙවන ලද වාරික මුදල, ශ්‍රී ලංකා රුපියල් වලින් ගෙවා තිබූ අතර, එලෙස ගෙවා තිබූ රුපියල් වටිනාකම ඇමෙරිකානු ඩොලර් වලට පරිවර්තනය කොට ඒ වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන දත්ත පද්ධතියෙහි (Commonwealth Secretariat - Debt Recording and Management System - CS-DRMS) සටහන් කිරීමේදී වැරදි විදේශ විනිමය අනුපාතයක් සඳහන්ව තිබීම හේතුවෙන් ඊට අදාළ ඇමරිකානු ඩොලර් වටිනාකම ද වැරදි අගයක් ලෙස සටහන්ව ඇත.

කෙසේ වුවද, මෙලෙස සිදුවී තිබූ විනිමය අනුපාතයේ දෝෂය 2023 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවල ගලපා දැනටමත් නිවැරදි කර ඇත.

සැබවින්ම ඉහත ණය මුදලට අදාළව ණය වාරික ගෙවනු ලබන්නේ ශ්‍රී ලංකා රුපියල් වලින් බැවින් මේ සඳහා ශ්‍රී ලංකා රුපියල් ගෙවා ඇමෙරිකානු ඩොලර් මිලදී ගැනීමේ අවශ්‍යතාවක් පැන නොනගින අතර, ඒ අනුව ඇමරිකානු ඩොලර් මිලදී ගැනීම සඳහා ඉතා ඉහළ විනිමය අනුපාතයක් යොදා ගෙන යන්න අදාළ කරුණක් නොවේ.

නමුත් සිදුව ඇත්තේ CS - DRMS දත්ත පද්ධතියේ සටහන් කිරීමේදී අතපසුවීමකින් වැරදි විනිමය අනුපාතයක් සටහන් වීමෙන් පරිවර්තනය කරන ලද ඇමරිකානු ඩොලර් වටිනාකම එම පද්ධතිය තුළ දෝෂ සහිතව සටහන් වීම පමණි. කෙසේ වුවද, මෙලෙස සිදුවූ අතපසු වීම 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගලපා නිවැරදි කර, ඒ බව විගණකාධිපතිවරයා වෙත මේ වනවිටත් වාර්තාකර ඇත.

එබැවින් ඇතැම් මාධ්‍ය විසින් පළ කර තිබූ පරිදි මූල්‍ය අපරාධයක් හෝ එවැනි වෙනත් වරදක් සිදුවී නොමැති බව මෙයින් තහවුරු කරනු ලැබේ. එමෙන්ම අදාළ වාර්ෂික වාර්තාවේ දක්වා ඇති සියලුම විගණන විමසුම්වලට මුදල් අමාත්‍යංශය ලබාදුන් පිළිතුරු ඉතා කඩිනමින් ප්‍රකාශයට පත් කිරීමට මේ වනවිට කටයුතු කරමින් සිටී. එවැනි ක්‍රියාමාර්ගයක් තුළින් ඉදිරියේදී මෙවැනි නොමග යවන සුළු අදහස් දැක්වීම් වලක්වාගත හැකිවනු ඇතැයි විශ්වාස කෙරේ.

වර්ෂයකදී රුපියල් බිලියන ගණනක වටිනාකමින් යුක්ත ණය ගණුදෙනු දහස් ගණනක් සිදුවන මෙවැනි ආයතනයක මෙවැනි ආකාරයේ වාර්තාකිරීමේ අඩුපාඩු සිදුවීම ස්වභාවික වන අතර, එලෙස සිදුවන වාර්තා කිරීමේ අඩුපාඩු පෙන්වාදීම විගණනයේද වගකීමක් ලෙස සලකමු. එසේම, ඒවා නිවැරදි කිරීමට කටයුතු කිරීමද මුදල් අමාත්‍යංශය වැනි ආයතනයක වගකීමක් ද වේ. කෙසේ වුවද, දැනටමත් නිවැරදි කොට ඇති මෙවැනි වාර්තාකිරීමේ අඩුපාඩු මූල්‍ය වංචා/ මූල්‍ය අපරාධ ලෙස පෙන්වා දීම පිළිබඳ කණගාටුව පළ කරමු.